# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## 2017 මැයි මස 05 වන දින

## II වන කොටස

## අතිරේකය

(2017. 05. 08 දින නිකුත් කරන ලදී)

# අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ (සංශෝධන)

**2015 අංක 4 දරන අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

අධිකරණ අමාත්‍යතුමාගේ නියමය පරිදි පළකරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක.

මිළ : රු. 6.00 යි. තැපැල් ගාස්තුව : රු. 10.00 යි.

**නීතිය බලපෑමේ ප්‍රකාශය**

***2 වන වගන්තිය*** : මෙම වගන්තිය මගින්, 2015 අංක 4 දරන අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනතේ 31 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ අපරාධයක වින්දිතයකුට හෝ සාක්ෂිකරුවකුට ශ්‍රී ලංකාවෙන් පිටත යම් දුරස්ථ ස්ථානයක සිට සාක්ෂි දීමට හෝ ප්‍රකාශයක් කිරීමට හැකියාව ලබා දීම ය.

# අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ (සංශෝධන)

එල්.ඩී.— ඕ. 48/2016

**2015 අංක 4 දරන අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

**1.** මේ පනත 2017 අංක  දරන අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

**2.** 2015 අංක 4 දරන අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනතේ 31 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— 2015 අංක 4 දරන පනතේ 31 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) එම වගන්තියේ (1) වන උපවගන්තියේ "ශ්‍රී ලංකාව තුළ" යන වචන වෙනුවට "ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත" යන වචන ආදේශ කිරීමෙන් ;

(2) එම වගන්තියේ (1) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන් :—

"(1අ) (1) වන උපවගන්තිය යටතේ යම් අපරාධයක වින්දිතයකුගේ හෝ සාක්ෂිකරුවකුගේ යම් සාක්ෂියක් හෝ ප්‍රකාශයක් ශ්‍රී ලංකාවෙන් පිටත යම් දුරස්ථ ස්ථානයක දී ලබා ගැනීමට අවශ්‍ය වන අවස්ථාවක දී, ඒ අපරාධයේ වින්දිතයා හෝ සාක්ෂිකරු සාක්ෂි දීමට හෝ ප්‍රකාශය කිරීමට බලාපොරොත්තු වන්නා වූ රටෙහි ශ්‍රී ලංකා රජයේ දූත මණ්ඩල කාර්යාලයේ දී එය වාර්තාගත කරනු ලැබිය යුතු ය." ; සහ

(3) එම වගන්තියේ (4) වන උපවගන්තිය ඉවත්කර, ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

2—PL 005156 -475 (2017/04)

"(4) මේ වගන්තිය කාර්ය සඳහා —

(අ) "අධිකරණය" යන්නෙන්, අපරාධ නඩු කටයුතු පවත්වන්නා වූ අධිකරණයක් අදහස් වේ ; සහ

(ආ) "රජයේ නිලධරයා" යන්නට, ශ්‍රී ලංකා විදේශ සේවයේ සේවය කරන නිලධරයෙක් ද ඇතුළත් වේ.".

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**3.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.